සැ. යු. - 2021.01.08 දින අංක 2210 දරන ගැසට් පත්‍රයේ I : III කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,211 - 2021 ජනවාරි මස 15 වැනි සිකුරාදා - 2021.01.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | 2 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 2 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 3 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 පෙබරවාරි මස 05 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 ජනවාරි මස 22 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1– B 82095 — 403 (2021/01)

# වෙනත් පත්කිරීම් ආදිය

## නිවේදනයයි

2021 අංක 67

ගරු විදේශ ඇමතිතුමන් විසින් 2020 දෙසැම්බර් මස 10 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි කොළඹ නියුතු ඕස්ට්‍රියානු ජනරජයේ නිර්වේතනික කොන්සල්වරයා ලෙස තෝමස් ෆ්‍රැන්ක් ඩෙට්වෙලර් මහතා සතුටින් පිළිගෙන ඇත.

අද්මිරාල් මහාචාර්ය ජයනාත් කොළඹගේ,
ලේකම්,
විදේශ අමාත්‍යාංශය.

2021 ජනවාරි මස 07 වැනි දින,
කොළඹ 01,
ජනරජ ගොඩනැගිල්ලේ,
විදේශ අමාත්‍යාංශයේ දී ය.

01 - 505

# රජයේ නිවේදන

**1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනත**

**8 වන වගන්තිය යටතේ නියමය**

1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, වැවිලි අමාත්‍ය වෛද්‍ය රමේෂ් පතිරණ වන මම, මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව මෙම නියමයෙන් -

(1) මෙහි පළමුවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කාර්යයන් සඳහා සංස්ථාපනය කරන ලද මෙම කෘෂිකාර්මික ව්‍යාපාරය එම කාර්යයන් සඳහා පමණක් අදාළ වන කෘෂිකාර්මික ව්‍යාපාරයක් වශයෙන් නිශ්චය කරමි.

(2) ඉහත සඳහන් කෘෂිකාර්මික ව්‍යාපාරය පිහිටුවීමේ හා ඉදිරියට කරගෙන යාමේ කාර්යයන් සඳහා අලෙවි මණ්ඩලයක් පිහිටුවන බව ප්‍රකාශ කරමි.

(3) එම අලෙවි මණ්ඩලයට "කුළු බඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලය" යන නාමය ලබා දෙන අතර මෙහි දෙවන උපලේඛනයේ දක්වා ඇති පරමාර්ථ එම මණ්ඩලයේ පර්මාර්ථ බව සඳහන් කරමි.

(4) අලෙවි මණ්ඩලයේ ප්‍රධාන ව්‍යාපාරික කටයුතු වන්නේ කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදනවල ගුණාත්මක භාවය ඉහළ නැංවීම, ප්‍රතීතන සහතිකකරණය මෙන්ම අගය එකතු කිරීම, නිෂ්පාදන දිරි ගැන්වීම, නව තාක්ෂණ ක්‍රමවේදයන් හඳුන්වා දීම හා අපනයනාභිමුඛ වෙළඳපොල ප්‍රවර්ධනය උදෙසා විධිමත් ලෙස සැකසුණු යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම බවත් එහි ප්‍රධාන කෘෂි ව්‍යාපාරික කාර්යභාරය ඉටු කරන ස්ථානය කොළඹ බවත් ප්‍රකාශ කරමි.

(5) අලෙවි මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සංඛ්‍යාව සත් දෙනෙකු වන බව නියම කරමි.

(6) මෙහි තුන්වන උපලේඛනයේ සඳහන් කරනු ලැබ ඇති සංයුතියෙන් සමන්විත සාමාජිකයින් අලෙවි මණ්ඩල සාමාජිකයින් වශයෙන් ප්‍රකාශයට පත් කරමි.

(7) කුමුදිනී ගුණසේකර මහත්මිය, අලෙවි මණ්ඩලයේ සභාපති ලෙස දැනට පත්කර ඇත.

**වෛද්‍ය රමේෂ් පතිරණ (පා.ම),**
වැවිලි අමාත්‍ය.

2021 ජනවාරි මස 15 වැනි දින,
වැවිලි අමාත්‍යාංශය,
සෙත්සිරිපාය (දෙවන අදියර),
බත්තරමුල්ල.

**පළමුවන උපලේඛනය**

කෘෂිකාර්මික ව්‍යාපාරය මගින් ඉටු කරනු ලබන කාර්යයන් පහත දක්වා ඇත.

(1) සියළුම කුළුබඩු වර්ග ශ්‍රේණිගත කිරීම, තත්ව පරීක්ෂා කිරීම, සහතික කිරීම මගින් එම නිෂ්පාදන සඳහා ප්‍රතීතන සහතික (Accreditation Certificate) ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සැලසීම, උපදෙස් ලබා දීම, තත්ව සහතික නිකුත් කිරීම කළ හැකි ආයතනයක් ලෙස කටයුතු කිරීම.

(2) නිෂ්පාදකයන්ට වාසිදයක මිලක් ලබාදීමටත්, කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන වඩාත් යෝග්‍ය ලෙස කඩිනමින්

අලෙවි කිරීමටත්, නිමි නිෂ්පාදන දිරිගැන්වීමටත්. අපනයනය කිරීමට හැකිවනු පිණිස දිරිගැන්වීම් ක්‍රියාත්මක කිරීම, පුද්ගලික අංශයේ ආයෝජකයින් සහ දේශීය විදේශීය ගැනුම්කරුවන් හඳුන්වා දීම.

(3) කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අගයදම සංවර්ධනය කිරීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන සැලසීම. අගය එකතු කිරීම සඳහා පර්යේෂණ සහ නව්‍යකරණ (Research and Innovations) මගින් නව නිෂ්පාදන හඳුන්වා දීම.

(4) පවතින දේශීය හා විදේශීය වෙළඳපොල කටයුතු ප්‍රවර්ධනය කිරීමටත්, නව වෙළෙඳපොල සොයා ගැනීමටත් ඒ සඳහා අවශ්‍ය අලෙවිකරන ක්‍රමෝපායන් ක්‍රියාවට නංවීමටත්, දේශීය ව්‍යවසායකයින් හා විදේශීය දූත මණ්ඩල සමග සාකච්ඡා කොට කුළුබඩු අලෙවිය ප්‍රවර්ධනය කිරීමටත් අපේක්ෂා කෙරේ.

**දෙවන උපලේඛනය**

මෙම මණ්ඩලයේ පරමාර්ථය පළමුවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් පරමාර්ථ වන්නේ ය.

**තුන්වන උපලේඛනය**

අලෙවි මණ්ඩලයේ සාමාජිකයෝ :

(01) සභාපති/අධ්‍යක්ෂ
(02) ප්‍රධාන විධායක නිලධාරි/අධ්‍යක්ෂ
(03) අධ්‍යක්ෂ - 03
ගරු අමාත්‍යවරයාගේ උපදෙස් අනුව පත් කරනු ලබන අදාළ විෂය සම්බන්ධ දැනුමැති අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු.
(04) අධ්‍යක්ෂ - මහා භාණ්ඩාගාරය නියෝජිත නිලධාරියකු.
(05) අධ්‍යක්ෂ - විෂයභාර අමාත්‍යාංශය නියෝජිත නිලධාරියෙකු

01 - 305

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වෙනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී (ලියාපදිංචි අංකය පී.කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ගිණුම් අංකය : 1113028755.
ණය ගිණුම් අංකය : 2135788.
සෙයිඩ් කාන් මොහොමඩ් සදත්.

2019 නොවැම්බර් මස 29 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් හා ඒකඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඒ. එස්. ඩී. මුණසිංහ විසින් 2017 ජූනි මස 19 වැනි දින සහතික කරන ලද අංක 1143 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී නමට ලියන ලද්දවූ ද බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සෙයිඩ් කාන් මොහොමඩ් සදත් ණයකරු හැටියට පැහැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් මිලියන හැත්තෑ හයයි හය ලක්ෂ අසූ නව දහස් පන්සිය හතළිස් හතරයි ශත විසි හතරක (රු. 76,689,544.24) මුදලක් 2019 ඔක්තෝබර් මස 22 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හට දැන් අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන හැත්තෑ හයයි හය ලක්ෂ අසූ නව දහස් පන්සිය හතළිස් හතරයි ශත විසි හතරක (රු. 76,689,544.24) මුදල අයකර ගැනීම සඳහා සහ 2019 ඔක්තෝබර් මස 23 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 20,668,627.67ක මුදලක් මත වර්ෂයකට 28% බැගින් සහ රු. 46,424,000ක මුදලක් මත වර්ෂයකට 16.50% බැගින් වැඩිපුර වාර්ෂික පොළිය ද සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තාවූ යම් මුදලක් වේ නම් ඒවා ද අඩු කොට එකී අංක 1143 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හට උකස් කොට ඇත්තාවූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ 12, හල්ෆ්ට්ඩෝප් වීදියේ 2 වන මහලේ, අංක 200 දරන ස්ථානයේ බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහනගර සභා සීමා ඇතුළත කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාලිගාවත්ත නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ශ්‍රී සද්ධර්ම මාවත ඔස්සේ මාලිගාවත්ත නැගෙනහිර හි පිහිටි ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. කනගසිංගම් විසින් 2015.06.26 වැනි දින පිළියෙල කරන ලද අංක 4375 දරන පිඹුරෙන් බෙද වෙන් කරන ලද ලොට් X වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : ශ්‍රී සද්ධර්ම මාවතේ, වරිපනම් අංක 91 සහ G 99 දරන පරිශ්‍ර මගින් ද, නැගෙනහිරට : ශ්‍රී සද්ධර්ම මාවත මගින් ද, දකුණට : ශ්‍රී සද්ධර්ම මාවතේ, වරිපනම් අංක G 83 සහ 85 A දරන පරිශ්‍ර මගින් ද සහ බස්නාහිරට : මාලිගාවත්ත ජුම්මා මස්ජිඩ් පාරේ, වරිපනම් අංක 222/9 සහ 222/8 දරන පරිශ්‍ර මගින් ද මායිම් වූ එක අංක 4375

දරන පිඹුර ප්‍රකාරව පර්චස් එකොළහයි දශම නවයයි හයක (අ. 0, රූ. 0, පර්. 11.96) විශාලත්වයෙන් වූ ඉඩම සමග වන මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම පත්ඉරුව D/178/144 යටතේ ලියාපදිංචි කොට ඇත.

ආර්. ඒ. පී. රාජපක්ෂ,
සමාගම් ලේකම්.

01 - 438

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වෙනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී (ලියාපදිංචි අංකය පී.කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

අබ්දුල් හමීඩ් මොහමඩ් නසීර්.
ණය ගිණුම් අංකය : 2223613.

2019 දෙසැම්බර් මස 20 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

කොච්චිකඩේ ප්‍රසිද්ධ නොතාරිස් පී. ඩී. ඊ. ප්‍රනාන්දු විසින් 2014.10.23 වැනි දින සහතික කරන ලද 14254 සහ 2017.04.06 වැනි දින සහතික කරන ලද අංක 15807 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී නමට ලියන ලද්දවූ ද බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම අබ්දුල් හමීඩ් මොහමඩ් නසීර් ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් (මෙහි 1 වන උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද ඉඩම.

කොච්චිකඩේ ප්‍රසිද්ධ නොතාරිස් පී. ඩී. ඊ. ප්‍රනාන්දු විසින් 2015.12.18 වැනි දින සහතික කරන ලද 14993, 2016.12.07 වැනි දින සහතික කරන ලද අංක 15624, 2017.04.06 වැනි දින සහතික කරන ලද අංක 15805 සහ 2018.07.19 වැනි දින සහතික කරන ලද අංක 16574 දරන උකස් බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම අබ්දුල් හමීඩ් මොහමඩ් නසීර් ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් (මෙහි 2 වන උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද ඉඩම.

කොච්චිකඩේ ප්‍රසිද්ධ නොතාරිස් පී. ඩී. ඊ. ප්‍රනාන්දු විසින් 2017.04.06 වැනි දින සහතික කරන ලද අංක 15806 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී නමට ලියන ලද්ද වූ ද බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම අබ්දුල් හමීඩ් මොහමඩ් නසීර් ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් (මෙහි 3 වන උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද ඉඩම)

එකී බැඳුම්කරයන් යටතේ රුපියල් මිලියන පනස් නවයයි හය ලක්ෂ හැට අට දහස් පන්සිය අනූවයි ශත විසි හතක (රු. 59,668,590.27) මුදලක් 2019 නොවැම්බර් මස 15 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හට දැන් අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන පනස් නවයයි හය ලක්ෂ හැට අට දහස් පන්සිය අනූවයි ශත විසි හතක (රු. 59,668,590.27) මුදල අයකර ගැනීම සඳහා සහ 2019 නොවැම්බර් මස 16 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 51,000,000ක මුදලක් මත වර්ෂයකට 15.0% බැගින් වැඩිදුර වාර්ෂික පොළිය ද සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තාවූ යම් මුදලක් වේ නම් ඒවා ද අඩු කොට එකී අංක 14254, 15807, 14993, 15624, 15805, 16574 සහ 15806 දරන බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හට උකස් කොට ඇත්තාවූ ද මෙහි පහත 1 වන, 2 වන සහ 3 වන උපලේඛනවල සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ 12, හල්ෆ්ට්ඩෝප් වීදියේ 2 වන මහලේ, අංක 200 දරන ස්ථානයේ බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### 1 වන උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය ඇතුළත කටුගම්පොල හත්පත්තුවේ, යාගම් පත්තු කෝරළේ, උඩුබැද්දාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ යාගම්වෙල ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුළත යාගම්වෙල ගමේ පිහිටි කුඹුක්ගහවත්ත සහ මයිලගහහේන නමැති ඉඩමට ජේ. ඒ. රෝහිත ජයලත් එල්. එස්. විසින් 2014.05.19 වැනි දින පිළියෙල කරන ලද අංක 783B දරන පිඹුරෙන් බෙද මායිම් නියම කරන ලද ලොට් 2 වශයෙන් දක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : අංක 287 දරන පිඹුරේ ලොට් 2 වෙන්කරන ජීව වැට මගින් ද, නැගෙනහිරට : කළින් එච්. එම්. කරුණාදාසගේ සහ දැන් සිරිවර්ධනගේ ඉඩම මගින් ද. දකුණට : අංක 783B දරන පිඹුරේ ලොට් 3 මගින් ද සහ බස්නාහිරට : අංක 783B දරන පිඹුරෙ ලොට් 1 මගින් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව රූඩ් එකයි පර්චස් එකොළහයි දශම හතරක (අ. 0, රූ. 1, පර්. 11.4) විශාලත්වයෙන් වූ ඉඩම සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ A38/101 යටතේ ලියාපදිංචි කර ඇත.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය ඇතුළත කටුගම්පොල හත්පත්තුවේ, යාගම් පත්තු කෝරළේ, උඩුබැද්දාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ යාගම්වෙල ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුළත යාගම්වෙල ගමේ පිහිටි කුඹුක්ගහවත්ත සහ මයිලගහහේන නමැති ඉඩමට ජේ. ඒ. රෝහිත ජයලත් එල්. එස්. විසින් 2014.05.19 වැනි දින පිළියෙල කරන ලද අංක 783B දරන පිඹුරෙන් බෙද මායිම් නියම කරන ලද ලොට් 3 වශයෙන් දක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : අංක 783B දරන පිඹුරේ ලොට් 1 සහ ලොට් 2 මගින් ද, නැගෙනහිරට : කළින් එච්. එම්. කරුණාදාසගේ සහ දැන් සිරිවර්ධනගේ ඉඩම මගින් ද. දකුණට : කළින් එම්. එම්.

කරුණාදාසගේ සහ දූන් මුහම්මදු හුසෙයිමා සහ අබ්දුල් හමීදුගේ ඉඩම මගින් ද සහ බස්නාහිරට : දුම්මලසූරිය සිට යාගම්වෙල දක්වා ප්‍රාදේශීය සභා පාර මගින් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව රූඩ් එකයි පර්චස් දහතයි දශම නවයයි බිංදුවක (අ. 0, රූ. 1, පර්. 17.90) විශාලත්වයෙන් වූ ඉඩම සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ A38/102 යටතේ ලියාපදිංචි කර ඇත.

2 වන උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ. දෙමළ හත් පත්තුවේ, කුමාරපල්ලම් පත්තුවේ, ආනමඩුව ප්‍රාදේශීය සභා සීමා ඇතුළත ආනමඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත සන්ගට්ටිකුලම ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත සන්ගට්ටිකුලම ගමේ පිහිටි "සන්ගට්ටිකුලමහේන" නමැති ඉඩමට බලයලත් මිනින්දෝ ඒ. ඒ. විමලසේන විසින් 2001.10.18 වැනි දින පිළියෙල කරන ලද අංක 2605 දරන පිඹුරෙන් බෙද මායිම් නියම කර වෙන් කරන ලද ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : පාර (ප්‍රාදේශීය සභා) සහ FVP 1839 හි ලොට් 131 මගින් ද, නැගෙනහිරට :FVP 1839 හි ලොට් 132, 137 1/2 සහ 138 මගින් ද, දකුණට : FVP 1839 හි ලොට් 77 සහ 103 මගින් ද සහ බස්නාහිරට : පාර මගින් ද මායිම් වූ එකී අංක 2605 දරන පිඹුර ප්‍රකාරව අක්කර විසි එකයි රූඩ් දෙකයි පර්චස් දාහතරක (අ. 21, රූ. 2, පර්. 14) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

ඉහත ඉඩම පහත සඳහන් කරන ලද ඉඩමේ නැවත මැනීමක් වේ.

ඉහත කී සන්ගට්ටිකුලම ගමේ පිහිටි "සන්ගට්ටිකුලමහේන" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු විසින් 1910.04.18 වැනි දින පිළියෙල කරන ලද අංක 269295 දරන පිඹුරෙන් බෙද මායිම් නියම කර වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, ඊසානට : සන්ගට්ටිකුලම මගින් ද, ගිණිකොණට : රාජ්‍ය වනාන්තරය මගින් ද, නිරිතට : විශේෂ වෙන්කිරීම සහ රාජ්‍ය වනාන්තරය මගින් ද සහ වයඹට : විශේෂ වෙන්කිරීම සහ රාජ්‍ය වනාන්තරය මගින් ද මායිම් වූ එකී අංක 269295 දරන පිඹුර ප්‍රකාරව අක්කර විසි එකයි රූඩ් දෙකයි පර්චස් දහතරක (අ. 21, රූ. 2, පර්. 14) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව J 11/33 යටතේ ලියාපදිංචි කර ඇත.

3 වන උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පොල හත් පත්තුවේ, යාගම් පත්තු කෝරළේ. උඩුබැද්දාව ප්‍රාදේශීය සභා සීමා ඇතුළත උඩුබැද්දාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත පහළ යාගම්වෙල ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත යාගම්වෙල පිහිටි "මයිලගහහේන, කෝන්ගහවත්ත සහ කෝන්ගහහේන" නමැති ඉඩමේ කුලියාපිටිය දිස්ත්‍රික් උසාවි නඩු 10654/P ට බලයලත් මිනින්දෝරු ආර්. බී. නවරත්න විසින් 2006.08.10 වැනි දින පිළියෙළ කරන ලද අංක 5270 දරන පිඹුරෙන් බෙද මායිම් නියම කර වෙන් කරන ලද ලොට් 02B වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : අංක 419331 දරන පිඹුරේ ලොට් 98A මගින් ද, නැගෙනහිරට : එකී අංක 5270 දරන පිඹුරේ ලොට් 2C මගින් ද, දකුණට : එකී අංක 5270 දරන පිඹුරේ ලොට් 8 මගින් ද සහ බස්නාහිරට : එකී අංක 5270 දරන පිඹුරේ ලොට් 2A මගින් ද මායිම් වූ එකී අංක 5270 දරන පිඹුර ප්‍රකාරව රූඩ් එකයි පර්චස් තිස් හතරක (අ. 0, රූ. 1, පර්. 34) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව J 79/11 යටතේ ලියාපදිංචි කර ඇත.

පහත දැක්වෙන ඉඩම මතින් මාර්ග අයිතිය සමග වේ.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පොල හත් පත්තුවේ, යාගම් පත්තු කෝරළේ. උඩුබැද්දාව ප්‍රාදේශීය සභා සීමා ඇතුළත උඩුබැද්දාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත පහළ යාගම්වෙල ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත යාගම්වෙල පිහිටි " මයිලගහහේන, කෝන්ගහවත්ත සහ කෝන්ගහහේන" නමැති ඉඩමේ කුලියාපිටිය දිස්ත්‍රික් උසාවි නඩු 10654/P ට බලයලත් මිනින්දෝරු ආර්. බී. නවරත්න විසින් 2006.08.10 වැනි දින පිළියෙළ කරන ලද අංක 5270 දරන පිඹුරෙන් බෙද මායිම් නියම කර වෙන් කරන ලද ලොට් 08 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : ලොට් 106 (P.P 407327) සහ එකී අංක 5270 දරන පිඹුරේ ලොට් 01 සහ 02 මගින් ද, නැගෙනහිරට : එකී අංක 5270 දරන පිඹුරේ ලොට් 3 මගින් ද, දකුණට : එකී අංක 5270 දරන පිඹුරේ ලොට් 4, 5 සහ 7 මගින් ද සහ බස්නාහිරට : කොරකහවැටිය සිට යාගම්වෙල දක්වා ප්‍රාදේශීය සභා පාර මගින් ද මායිම් වූ එකී අංක 5270 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විසි දෙකයි දශම දෙකයි හතයි හතරක (අ. 0, රූ. 0, පර්. 22.274) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව A 101/172 යටතේ ලියාපදිංචි කර ඇත.

ආර්. ඒ. පී. රාජපක්ෂ,
සමාගම් ලේකම්.

01 - 439

---

## පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - අනුරාධපුර ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සීහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි

ණණුදෙනුකරුවන්ගේ නම් : කල්‍යාණි ජයවර්ධන සහ හේතුහාමිගේ කමලාවතී.

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනාව වර්ෂ 2020 ඔක්තෝබර් මස 27 වැනි දින ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව වර්ෂ 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දනුම් දෙනු ලැබේ.

එනම්, කල්‍යාණි ජයවර්ධන සහ හේතුහාමිගේ කමලාවතී යන අය "බන්ධනදායීන්" වශයෙන් ද හේතුහාමිගේ කමලාවතී යන අය "උකස්කරු" වශයෙන්ද ලියාපදිංචි අංක පී.කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට අනුරාධපුර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. වී. ඒ. දිසානායක විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2017.05.22 දිනැති අංක 8999 දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය මත වර්ෂ 2018.10.25 දිනැති අංක 9292 දරන ද්වීතියික උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර ඇති හෙයින් ද,

ඉහත කී පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතුවට "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන) වෙත ඉහත කී අංක 8999 සහ 9292 දරන උකස්කරයන් මත, වර්ෂ 2020.03.03 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් හතළිස් හය ලක්ෂ හතළිස් හත් දහස් තුන්සිය විසි අටයි ශත හැත්තෑ එකක (රු. 4,647,328.71) මුදලක් ද, වර්ෂ 2020.03.04 වැනි දින සිට රුපියල් හතළිස් තුන් ලක්ෂ හැත්තෑ එක් දහස් තුන්සිය විසි හතරයි ශත හතළිස් එකක (රු. 4,371,324.41) මුදල මත වර්ෂයකට 23%ක පොළිය ද, ඉහත කී බන්ධනදයීන්ගෙන්/ උකස්කරුගෙන් අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත්,

ඉහත කී උකස්කරයන් මත අයවිය යුතු මුදල වන රුපියල් හතළිස් හය ලක්ෂ හතළිස් හත් දහස් තුන්සිය විසි අටයි ශත හැත්තෑ එකක (රු. 4,647,328.71) මුදල ඉහත කී දිනයේ සිට වෙන්දේසියේ දිනය දක්වා ඉහත සඳහන් කර ඇති ආකාරයට පොළිය ද, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු සහ මුදල් ද (යම් මුදලක් ගෙවා ඇතොත් එකී මුදල අඩු කිරීමෙන් පසු) අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇති බැංකුව වෙත උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා වර්ෂ 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව කොලොන්නාව, විහාර මාවත, අංක 50/3 හි පදිංචි බලයලත් වෙන්දේසිකරු තුසිත කරුණාරත්න වෙත අධිකාරිය සහ බලය පවරන යෝජනාවක් මෙයින් සම්මත කර ගනු ලැබේ.

**උපලේඛනය**

උතුරු මැද පළාතේ, අනුරාධුපර දිස්ත්‍රික්කයේ, තඹුත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේදී, තම්මැන්නාගම අංක 424 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මයිල්ලෑව ග්‍රාමයේ යාය 07, තඹුත්තේගම පිහිටි සහ සර්වේයර් ජනරාල් විසින් මැන සාදන ලද කලාව 01හි පිඹුරු අංක 110053හි ක්ෂේත්‍ර පත්‍ර අංක 05හි ලොට් අංක 972න් දැක්වෙන රජයේ ඉඩම වන උතුරින් : ලොට් අංක 971, නැගෙනහිරින් : ලොට් අංක 971, 196 සහ 973 ද, දකුණින් : ලොට් අංක 973, 257 සහ 246 ද, බස්නාහිරින් : ලොට් අංක 246 සහ 971 ද මායිම් වූ ප්‍රමාණයෙන් හෙක්ටෙයාර් බින්දුවයි දශම එකයි බින්දුවයි දෙකයි නවයක (හෙක්ටයාර් 0.1029) විශාලත්වය ඇති ඉඩම සහ ප්‍රවේශ මාර්ගය ලෙස සළකුණු කර ඇති පාර ඔස්සේ සහ මතින් වන මාර්ග අයිතිය ද සමග හි පිහිටි ගොඩනැගිලි, වැවිලි සහ අනිකුත් සියලු දෙය වේ. මෙම අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම්/පත්ඉරු P 03/43 හි ලියාපදිංචි වී ඇත.

එකී ඉඩම මෑතකදී සිදුකළ මැනීමක් වන බලයලත් මිනින්දෝරු සී. එස්. ලියනගේ විසින් සම්පාදිත 2017.01.10 දිනැති අංක CS/2017/08 දරන පිඹුරේ ලොට් 972 යනුවෙන් දැක්වෙන පරිදි උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, තඹුත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තම්මැන්නාගම අංක 424 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මයිල්ලෑව ග්‍රාමයේ යිය 07, තඹුත්තේගම පිහිටි උතුරින් : ලොට් අංක 971, නැගෙනහිරින් : ලොට් අංක 971, 196 සහ 973 ද, දකුණින් : ලොට් අංක 973, 257 සහ 246 ද, බස්නාහිරින් : ලොට් අංක 246 සහ 971 ද මායිම් වූ ප්‍රමාණයෙන් හේක්ටෙයාර බින්දුවයි දශම එකයි බිංන්දුවයි දෙකයි නවයක (0.1029 හෙක්ටෙයාර) ක් හෝ රූඩ් රදකයි පර්චස් බින්දුවයි දශම හයයි අටක් විශාලත්වය ඇති ඉඩම එහි පිහිටි ගොඩනැගිලි, වැවිලි සහ අනිකුත් සියලු දෙය වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

අරුණ ගුරුගේ,
සහකාර කළමණාකරු - ණය අයකර ගැනීම්.

01 - 450

---

**පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - කඳුරුවෙල ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සීහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි

ණුදෙනුකරුගේ නම : විතාන අප්පුහාමිගේ රණතුංග.

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2020.12.17 වැනි දින පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී

එනම්, ඉහත කී විතාන අප්පුහාමිලාගේ රණතුංග යන අය "බන්ධනදායී/උකස්කරු" ලෙස ද ලියාපදිංචි අංක පී.කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට පොළොන්නරුව ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඒ. අබේවර්ධන විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2013.05.07 වැනි දිනැති අංක 1855 දරන ප්‍රාථමික චල උකස්කරය, වර්ෂ 2017.03.08 වැනි දිනැති අංක 2912 දරන ද්විතීක උකස්කරයන් මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

ඉහත කී පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතුවට "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන) වෙත ඉහත කී අංක 1855 සහ 2912 දරන උකස්කරයන් මත, වර්ෂ 2020.12.02 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් හැත්තෑ තුන් ලක්ෂ හතලිස් හතර දහස් හාරසිය අනූ හතරයි ශත හැත්තෑහය (රු. 7,344,494.76) මුදලක් ද, සහ වර්ෂ 2020.12.03 වැනි දින සිට සම්පූර්ණ මුදල් ගෙවා නිමවන තුරු රුපියල් හැටඑක්ලක්ෂ හැටඅට දහස් හත්සිය පනස් හතරයි ශත දහතුන (රු. 6,168,754.13)ක් දක්වා වූ මුදල මත වර්ෂයකට 19%ක පොළිය ද, ඉහත කී බන්ධනදයී/උකස්කරුගෙන් බැංකුව වෙත අයවිය යුතු සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත්,

ඉහත කී උකස්කරයන් මත අයවිය යුතු සම්පූර්ණ මුදල වන රුපියල් හැත්තෑ තුන් ලක්ෂ හතලිස් හතර දහස් හාරසිය අනූ හතරයි ශත හැත්තෑහය (රු. 7,344,494.76)ක මුලු මුදල සහ ඉහත සඳහන් දිනයේ සිට වෙන්දේසියේ දිනය දක්වා ඉහත සඳහන් කර ඇති ආකාරයට පොළිය ද, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු සහ මුදල් ද (යම් මුදලක් ගෙවා ඇතොත් එකී මුදල අඩු කිරීමෙන් පසු) අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇති බැංකුව වෙත උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා වර්ෂ 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව මහනුවර, මාවිල්මඩ, දුටුගැමුණු මාවත , අංක 369/1හි පදිංචි බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය වෙත අධිකාරිය සහ බලය පවරන යෝජනාවක් මෙයින් සම්මත කර ගනු ලැබේ.

### උපලේඛනය

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව ප්‍රාදේශීය සභා සීමාවේ, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ මැදපත්තුවේ, අංක 72B අලුත්වැව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, කදුරුවෙල ග්‍රාමයේ, උඩවෙලගම පිහිටා ඇති සහ අංක F C P PO 34 දරන පිඹුරෙහි ලොට් 28 ලෙස නිරූපිත ''පට්ටියදමන'' නමැති ඉඩමෙහි බෙදා වෙන් කළ කොටසක් වන බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඒ. පියදස විසින් මැන සාදන ලද වර්ෂ 1998.08.08 දිනැති අංක 127/98 දරන පිඹුරෙහි දක්වෙන ලොට් 1 සහ 2 හි නැවත මැනීමක් වන බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. සී. ඩයස් විසින් මැන සාදන ලද වර්ෂ 2005.01.15 දිනැති අංක 823 දරන පිඹුරෙහි ''ලොට් 2'' දරන ඉඩමට මායිම් උතුරින් ඃ අංක F C P PO 34 දරන පිඹුරෙහි ලොට් 220 ද, නැගෙනහිරින් ඃ අංක F C P PO 34 දරන පිඹුරෙහි ලොට් 33 ද, දකුණට ඃ අංක F C P PO 34හි කොටසක් ලොට් 323 සහ කොටස් 321 සහ ඩබ්ලිව්. ඒ. රණතුංග විසින් වගා කරන ලද බිම ද, සහ බස්නාහිරට ඃ මෙම පිඹුරේම ලොට් 1 ද මායිම් වූ ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් දෙකයි පර්චස් පහයි දශම පහ (අ. 1, රූ. 2, පර්. 5.5) ක් විශාලත්වය ඇති ඉඩම වේ.

ඉහත ඉඩම පහත විස්තර කර ඇති ඉඩමෙන් බෙදා වෙන් කරන ලද ඉඩමක් වේ.

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව නගර සභා සීමාවේ, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ මැදපත්තුවේ, අංක 72B අලුත්වැව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, කදුරුවෙල ග්‍රාමයේ, උඩවෙලගම පිහිටා ඇති ''පට්ටියදමන'' ඉඩමෙන් බෙදා වෙන් කල ලද කොටසක් වන අංක F C P PO 34 දරන පිඹුරෙහි ලොට් 28 ලෙස සර්වේයර් ජනරාල් ඉඩමට මායිම් උතුරින් ඃ ලොට් 334, 220 ද, නැගෙනහිරින් ඃ ලොට් 33 ද, දකුණට ඃ ලොට් 221 ද සහ බස්නාහිරට ඃ ලොට් 320 ද මායිම් වූ ප්‍රමාණයෙන් අක්කර තුනයි පර්චස් එකොළහයි (අ. 3, රූ. 0, පර්. 11)ක් විශාලත්වය ඇති ඉඩම වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

අරුණ ගුරුගේ,
සහකාර කළමණාකරු - ණය අයකර ගැනීම්.

01 - 451

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සීහි (ලියාපදිංචි අංක පීකිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි

ණය ගිණුම් අංක ඃ 2202212 සහ 2245507.
ඉනායතුල්ලා මොහමඩ් ඉර්ෂාඩ්.

2019 දෙසැම්බර් මස 20 වැනි දින පැවැත්වූ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් පරිදි විශේෂිතව හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් කේ. වී. ඒ. ඩී. සී. කේ. විපුලසේන විසින් සහතික කරන ලද 2016 ජුනි මස 16 වැනි දින අංක 1841 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී නමින් වූ බැඳුම්කරය යටතේ ඉනායතුල්ලා මොහමඩ් ඉර්ෂාඩ් යන අය බන්ධනදයී වශයෙන් කොපර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී වෙත ගෙවිය යුතුව හා අයවිය යුතුව ඇති මුදල් ගෙවීම පැහැර

හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් තිස්අට මිලියන විසිඅටදහස් හාරසිය හතලිස් තුනයි ශත අනූඑකක (රු. 38,028,443.91) මුදලක් 2019.10.18 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් තිස්අට මිලියන විසිඅටදහස් හාරසිය හතලිස් තුනයි ශත අනූඑකක (රු. 38,028,443.91) ක මුදල ද හා 2019.10.19 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට ද රු. 30,479,300ක මුදලක් සඳහා වාර්ෂිකව 16% බැගින් වූ වැඩිදුර පොළිය ද, රුපියල් 5,840,000/- මුදලක් සඳහා වාර්ෂිකව 28% බැගින් වූ වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් හා වෙනත් යම් ගෙවීමක් ඇතොත් ඒවා ද මේ වන විට කරනු ලැබූ (යම්) ගෙවීමක් ඇතොත් එය ද අඩුකර අයකර ගැනීම සඳහා එකී අංක 1841 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී වෙත උකස්කර ඇති මෙහි පහත උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කරන ලද දේපළ හා පරිශ්‍රයන් මහනුවර, මාවිල්මඩ, ලේවැල්ල පාර, දුටුගැමුණු මාවතේ, අංක 369/1 හි බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ පැවරී ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩලය මෙයින් සම්මත කර ගනී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රිකකයේ, යටිනුවර මැදපළාත යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය යටිනුවර ප්‍රාදේශීය සභා සීමාවන් තුළ පිළිමතලාව ග්‍රාම නිලධාරී වසම හි පිළිමතලාව ගමේ පිහිටි ''ඇස්වැද්දුම්වත්ත'' නමැති ඉඩමට බලයලත් මානක කේ. බී. ලංසකාරනායක විසින් 04.12.2011 වැනි දින මැන සාදන ලද අංක 7518 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කළ ලොට් 01 නමැති ඉඩම් කොටසට මායිම් එනම්, උතුරට : නානුඔයෙන් ද, නැගෙනහිරට : අංක 432 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 01 න් ද, දකුණට : කොළඹ නුවර ප්‍රධාන මාර්ගයෙන් ද සහ බස්නාහිරට : අංක 432 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 03 න් ද යන මෙකී මායිම් තුළ පිහිටි වරිපනම් අංක 398 දරන දේපළ ගහකොළ, වගාව, ගොඩනැගිලි ඇතුළු අනෙකුත් සියලු දේ ඉඩමේ ප්‍රමාණය පර්චස් දෙළහයි දශම බිංදුවයි (අ. 0, රූ. 0, පර්. 12) මෙය මහනුවර ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව 472/258හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී ලොට් අංක 01 මැතකදී නැවත කරන ලද මැනුමකට අනුව පහත පරිදි විස්තර කර ඇත.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර මැදපළාත යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය යටිනුවර ප්‍රාදේශීය සභා සීමාවන් තුළ පිළිමතලාව ග්‍රාම නිලධාරී වසම් හි පිළිමතලාව ගමේ පිහිටි ''ඇස්වැද්දුමේවත්ත'' නමැති ඉඩමට බලයලත් මානක කේ. බී. ලංසකාරනායක විසින් 02.05.2015 වැනි දින මැන සාදන ලද අංක 8290 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කළ ලොට් 01 නමැති ඉඩම් කොටසට මායිම් එනම්, උතුරට : නානුඔයෙන් ද, නැගෙනහිරට : අංක 432 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 01 න් ද, දකුණට : කොළඹ නුවර ප්‍රධාන මාර්ගයෙන් ද සහ බස්නාහිරට : අංක 432 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 03 න් ද යන මෙකී මායිම් තුළ පිහිටි වරිපනම් අංක 398 දරන දේපළ ගහකොළ, වගාව, ගොඩනැගිලි ඇතුළු අනෙකුත් සියලු දේ ඉඩමේ ප්‍රමාණය පර්චස් දෙළහයි දශම බිංදුවයි (අ. 0, රූ. 0, පර්. 12) හෝ හෙක්ටයාර් 0.0304.

ආර්. ඒ. පී. රාජපක්ෂ,
සමාගම් ලේකම්.

21.01.2020.

01 - 449

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සීහි (ලියාපදිංචි අංක පීකිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි

ණය ගිණුම් අංක : 2245519.
සානෝ ඉම්පෙක්ස්.

2019 දෙසැම්බර් මස 20 වැනි දින පැවැත්වූ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් පරිදි විශේෂිතව හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් කේ. වී. ඒ. ඩී. සී. කේ. විපුලසේන විසින් සහතික කරන ලද 2014 සැප්තැම්බර් මස 01 වැනි දින අංක 1422 සහ 2015 නොවැම්බර් මස 24 වැනි දින අංක 1696 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී නමින් වූ බැඳුම්කරයන් යටතේ ''සානෝ ඉම්පෙක්ස් '' යන නාමය, විලාසය හා අභිධානය යටතේ තනි අයිතිකරු වශයෙන් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යනු ලබන ඉනායාතුල්ලා මොහමඩ් ඉර්ශාඩ් අය බන්ධනදයී වශයෙන් (මෙහි පහත සඳහන් 1 වන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ)

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් කේ. වී. ඒ. ඩී. සී. කේ. විපුලසේන විසින් සහතික කරන ලද 2016 ජූනි මස 16 වැනි දින අංක 1842 දරන කොපර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී නමින් වූ බැඳුම්කරය යටතේ ''සානෝ ඉම්පෙක්ස් '' යන නාමය විලාසය හා අභිධානය යටතේ තනි අයිතියකරු වශයෙන් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යනු ලබන ඉනායාතුල්ලා මොහොමඩ් ඉර්ෂාඩ් යන අය බන්ධනදයී වශයෙන් (මෙහි පහත සඳහන් 2 වන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ)

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී වෙත ගෙවිය යුතුව හා අයවිය යුතුව ඇති මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් තිස්එක් මිලියන අටසිය අනූහයදහස් එකසිය අනූහතයි ශත අසූ නමයක (රු. 31,896,197.89) මුදලක් 2019.10.18 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති

හෙයින් එකී රුපියල් 31,896,197.89) මුදල ද හා 2019.10.19 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රුපියල් 28,250,00/- ක මුදලක් සඳහා වාර්ෂිකව 16.5% බැගින් වූ වැඩි දුර පොළිය ද ප්‍රචාරක වියදම් හා වෙනත් යම් ගෙවීමක් ඇතොත් ඒවා ද මේ වන විට කරනු ලැබූ (යම්) ගෙවීමක් ඇතොත් එය ද අඩුකර අයකර ගැනීම සඳහා අංක 1422, 1696 සහ 1842 දරන බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී වෙත උකස් කර ඇති මෙහි පහත 1 වන සහ 2 වන උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කරන ලද දේපළ හා පරිශ්‍රයන් මහනුවර, මාවිල්මඩ, ලේවැල්ල පාර, දුටුගැමුණු මාවතේ, අංක 369/1 හි බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ පැවරී ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩලය මෙයින් සම්මත කර ගනී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර මැදපළාත යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය යටිනුවර ප්‍රාදේශීය සභා සීමාවන් තුළ ගුරුගම ග්‍රාම නිලධාරී වසම හි ගුරුගම ගමේ පිහිටි ''දෙලංගේ වත්ත සහ තලගහකුඹුරේ වත්ත'' නමැති ඉඩමට බලයලත් මානක එම්. ඉසෙඩ් ආබ්දීන් විසින් 1969.04.16 වැනි දින වඩාත් නිවැරදිව 1989.04.16 වැනි දින මැන සාදන ලද අංක 331 දරන පිඹුරේ නිරූපිත බෙද වෙන් කළ ලොට් 01 නමැති ඉඩම් කොටසට මායිම්, එනම් උතුරට : ගෝනකන්ගේකුඹුර සහ දෙලංගේකුඹුරෙන් ද, නැගෙනහිරට : එස්. එල්. ඒ. රහීම් විසින් හිමිකම්පාන මෙම ඉඩම වෙන් වන වෙද වැටෙන් හා අංක 1400 දරන පිඹුරේ නිරූපිත ලොට් 02න් ද, දකුණට : පිළිමතලාව සිට මුරුතලාව ප්‍රධාන මාර්ගයෙන් ද සහ බස්නාහිරට : එම්. එල්. එම්. මව්ෆර් විසින් හිමිකම්පාන මෙම ඉඩමේ ඉතිරි කොටසින් ද, හා අංක 1400 දරන පිඹුරේ නිරූපිත ලොට් 01න් ද යන මෙකී මායිම් තුළ පිහිටි ගොඩනැගිලි ගහකොළ, වගාව ඇතුළු අනෙකුත් සියලු දේ ඉඩමේ ප්‍රමාණය පර්චස් විසිඅටයි දශම දෙකයි පහක් (අ. 0, රූ. 0, පර්. 28.25)

මෙය මහනුවර ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍ඉරුව B393/290හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී ලොට් අංක 01 මැතකදී කරන ලද මැනුමකට අනුව පහත පරිදි විස්තර කර ඇත :

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර මැදපළාත යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, යටිනුවර ප්‍රාදේශීය සභා සීමාවන් තුළ ගුරුගම ග්‍රාම නිලධාරී වසම හි ගුරුගම ගමේ පිහිටි ''දෙලංගේ වත්ත සහ තලගහකුඹුරේ වත්ත '' නමැති ඉඩමට බලයලත් මානක කේ. බී. ලංසකාරනායක විසින් 2009.09.01 දින මැන සාදන ලද අංක 6800 දරන පිඹුරේ නිරූපිත බෙද වෙන් කළ ලොට් 01 නමැති ඉඩම් කොටසට මායිම් එනම් උතුරට : ගෝනකන්ගේකුඹුර සහ දෙලංගේකුඹුරෙන් ද, නැගෙනහිරට : එස්. එල්. ඒ. රහීම් විසින් හිමිකම් පාන (අංක 1400 දරන පිඹුරේ නිරූපිත ලොට් 02) වැටෙන් වෙන්වන මෙම ඉඩමේ ඉතිරි කොටසින් ද, දකුණට : පිළිමතලාව සිටි මුරුතලාව ප්‍රධාන මාර්ගයෙන් ද සහ බස්නාහිරට : එම්. එල් එම්. මව්ෆර් විසින් හිමිකම්පාන මෙම ඉඩමේ ඉතිරි කොටසින් ද හා අංක 1400 දරන පිඹුරේ නිරූපිත ලොට් 01න් ද යන මෙකී මායිම් තුල පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාව ඇතුළු අනෙකුත් සියලු දේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් විසිඅටයි දශම දෙකයි පහක් (අ. 0, රූ. 0, පර්. 28.25)

### දෙවන උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර මැදපළාත, යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය යටිනුවර ප්‍රාදේශීය සභා සීමාවන් තුළ පිළිමතලාව ග්‍රාම නිලධාරී වසම හි පිළිමතලාව ගමේ පිහිටි ''අස්වැද්දුමවත්ත '' නැමති ඉඩමට බලයලත් මානක කේ. බී. ලංසකාරනායක විසින් 2011.12.04 වැනි දින මැන සාදන ලද අංක 7518 දරන පිඹුරේ නිරූපිත බෙද වෙන් කළ ලොට් 01 නමැති ඉඩම් කොටසට මායිම් එනම්, උතුරට : නානුඔයෙන් ද, නැගෙනහිරට : අංක 432 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 01න් ද, දකුණට : නුවර සිට කොළඹ ප්‍රධාන මාර්ගයෙන් ද සහ බස්නාහිරට : අංක 432 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 03න් ද, යන මෙකී මායිම් තුළ පිහිටි වරිපනම් අංක 398 දරන ගොඩනැගිල්ල, ගහකොළ, වගාව ඇතුළු අනෙකුත් සියලු දේ ඉඩමේ ප්‍රමාණය පර්චස් දොළහයි දශම බිංදුවයි (අ. 0, රූ. 0, පර්. 12.00)

මෙය මහනුවර ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍ඉරුව B472/258හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී ලොට් අංක 01 මැතකදී කරන ලද මැනුමකට අනුව පහත විස්තර කර ඇත.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර මැදපළාත, යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය යටිනුවර ප්‍රාදේශීය සභා සීමාවන් තුළ පිළිමතලාව ග්‍රාම නිලධාරී වසම හි පිළිමතලාව ගමේ පිහිටි ''අස්වැද්දුමවත්ත '' නැමති ඉඩමට බලයලත් මානක කේ. බී. ලංසකාරනායක විසින් 2015.05.02 වැනි දින මැන සාදන ලද අංක 8290 දරන පිඹුරේ නිරූපිත බෙද වෙන් කළ ලොට් 01 නමැති ඉඩම් කොටසට මායිම් එනම්, උතුරට : නානුඔයෙන් ද, නැගෙනහිරට : අංක 432 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 01න් ද, දකුණට : නුවර සිට කොළඹ ප්‍රධාන මාර්ගයෙන් ද සහ බස්නාහිරට : අංක 432 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 03න් ද, යන මෙකී මායිම් තුළ පිහිටි වරිපනම් අංක 398 දරන ගොඩනැගිල්ල, ගහකොළ, වගාව ඇතුළු අනෙකුත් සියලු දේ ඉඩමේ ප්‍රමාණය පර්චස් දොළහයි දශම බිංදුවයි (අ. 0, රූ. 0, පර්. 12.00) හෙක්ටයාර් 0.0304.

ආර්. ඒ. පී. රාජපක්ෂ,
සමාගම් ලේකම්.

21.01.2020.

01 - 447

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සීහි (ලියාපදිංචි අංක පීකිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි

ණය ගිණුම් අංක : 1115020503
ණය ගිණුම් අංකය : 2238773, 1958554, 2362563, 2362554 සහ 2297410.
මොහොමඩ් කාසිම් මොහොමඩ් සිරාජ්.

2019 සැප්තැම්බර් මස 27 වැනි දින පැවැත්වූ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් පරිදි විශේෂිතව හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් කේ. වී. ඒ. ඩී. සී. කේ. විපුලසේන විසින් සහතික කරන ලද 2015.11.27 වැනි දින අංක 1699, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඩී. පෙරේරා විසින් සහතික කරන ලද 2017.08.23 වැනි දින අංක 127 සහ මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් කේ. වී. ඒ. ඩී. සී.කේ. විපුලසේන විසින් සහතික කරන ලද 2017.11.23 දින අංක 2203 සහ 2019.02.05 වැනි දින අංක 2544 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී නමින් වූ බැඳුම්කරයන් යටතේ **මොහමඩ් තාසීම් මොහමඩ් සිරාජ් යන අය බන්ධනදයී වශයෙන්** කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී වෙත ගෙවිය යුතුව හා අයවිය යුතුව ඇති මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් (මෙහි පහත 1 වන උපලේඛනයේ වැඩිමනත් ලෙස විස්තර වන දේපළ)

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. ඩී. එච්. කිරින්දේ විසින් සහතික කරන ලද 2015.06.05 වැනි දින අංක 3114 දරන බැඳුම්කරය යටතේ මොහමඩ් තාසීම් මොහමඩ් සිරාජ් යන අය බන්ධනදයී වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී වෙත ගෙවිය යුතු හා අයවිය යුතුව ඇති මුදල් ගෙවීම් පැහැර හැර ඇති හෙයින් (මෙහි පහත 2 වන උපලේඛනයේ වැඩිමනත් ලෙස විස්තර වන දේපළ)

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එස්. බී. පී. ටී. එස්. පතිරණ විසින් සහතික කරන ලද 2018.03.28 වැනි දින අංක 659 දරන බැඳුම්කරය යටතේ මොහමඩ් තාසීම් මොහමඩ් සිරාජ් යන අය බන්ධදනදයී වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී වෙත ගෙවිය යුතුව හා අයවිය යුතුව ඇති මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් (මෙහි පහත 3 වන උපලේඛනයේ වැඩිමනත් ලෙස විස්තර වන දේපළ)

එකී බැඳුම්කරයන් යටතේ රුපියල් හාරසිය හැටඑක් මිලියන හයලක්ෂ අසූපන්දහස් එකසිය හැට දෙකයි ශත දහඅටක (රු. 461,685,162.18) ක මුදලක් 2019.08.22 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද එකී රුපියල් හාරසිය තිස්දෙක මිලියන එක් ලක්ෂ හතළිස් හත්දහස් අටසිය අනූනවයක (රු. 432,147,899) ක මුදල හා 2019.08.23 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රුපියල් 62,828,899ක මුදලක් සඳහා වාර්ෂිකව 28% බැගින් ද රුපියල් 64,200,000/- සඳහා වාර්ෂිකව 13.84% බැගින් ද රුපියල් 57,619,000/- සඳහා වාර්ෂිකව 14% බැගින් ද රුපියල් 167,500,00/- සඳහා වාර්ෂිකව 14.34% බැගින් ද සහ රුපියල් 80,000,000/- සඳහා වාර්ෂිකව 15.84% බැගින් වූ වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් හා වෙනත් යම් ගෙවීමක් ඇතොත් ඒවා ද මේ වන විට කරනු ලැබූ (යම්) ගෙවීමක් ඇතොත් එය ද අඩුකර අයකර ගැනීම සඳහා එකී අංක 1699, 127, 2203, 2544, 3114 සහ 659 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී වෙත උකස් කර ඇති මෙහි පහත 1 වන 2 වන හා 3 වන උපලේඛනයන්හි වැඩිදුරටත් විස්තර කරන ලද දේපළ හා පරිශ්‍රයන් මහනුවර, මාවිල්මඩ, ලේවැල්ල පාර, දුටුගැමුණු මාවතේ, අංක 369/1 හි බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසිය විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ පැවරී ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් සම්මත කර ගනී.

#### උපලේඛනය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, හපුතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ හපුතලේ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ අංක 63ඊ හොරදොරුව ග්‍රාම නිලධාරි වසම උඩුකින්ද කොට්ඨාසය මහපළාත කෝරළේ හපුතලේගම පිහිටි ''කන්දේඅරාවේ එස්ටේට් '' දැන් ඌව හපුතලේ ටී කම්පනි යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක ආර්. ඒ. ඩබ්ලිව් එන් ජයසිංහ විසින් 1967.11.13 වැනි දින මැන සාදන ලද අංක 108 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කළ ඉඩම් කොටසට මායිම්, එනම් උතුරට : ඔය සහ කුඹුර වෙන් කරක කඳුර සහ කානුවෙන් ද, නැගෙනහිරට : කුඹුර වෙන් වෙන ඇළෙන් ද, දකුණට : පාලුගම සහ බොරලන්ද සිට හපුතලේට යන පී. ඩබ්ලිව්. ඩී. පාරෙන් ද සහ බස්නාහිරට : කඳුරෙන් ද යන මෙකී මායිම් තුළ පිහිටි ගහකොළ, වගාව, ගොඩනැගිලි ඇතුළු අනෙකුත් සියලු දේ ඉඩමේ ප්‍රමාණය අක්කර දෙකයි රූඩ් තුනයි පර්චස් එකයි (අ. 02, පර්. 03, පර්. 01)

බලයලත් මානක ආර්. ඒ. ඩබ්ලිව් එන්. ජයතුංග විසින් 1967.11.13 වැනි දින මැන සාදන ලද අංක 108 දරන පිඹුරේ සඳහන් පරිදි කර්මාන්ත ශාලාවේ ක්‍රියාකාරිත්වය සඳහා දැනට පාවිච්චි කරන ලද සියලුම යන්ත්‍ර යන්ත්‍රෝපකරණ ඇමුනුම් ආයුද මෙවලම් යනාදිය ඇතුළුවද වේ.

මෙය බදුල්ල ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ඩබ්ලිව් 03/124 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත විස්තර කර ඇති ඉඩම මෑතක දී දරන ලද මැනුමකට අනුව බලයලත් මානක එස්. පී. රත්නායක විසින් 2011.01.28 වැනි දින මැන සාදන ලද අංක 4195 දරන පිඹුර අනුව පහත පරිදි විස්තර කර ඇත.

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, හපුතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ හපුතලේ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ අංක

63ඒ හොරදොරුව ග්‍රාම නිලධාරී වසම උඩුකින්ද කොට්ඨාසය මහපළාත කෝරළේ, හොරදොරුව ගමේ පිහිටි ''කන්දේඅරාවේ එස්ටේට් '' නමැති ඉඩමට බලයලත් මානක එස්. පී. රත්නායක විසින් 2011.01.28 වැනි දින මැන සාදන ලද අංක 4195 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කළ ලොට් අංක 01 දරන ඉඩම් කොටසට මායිම් එනම්, උතුරට : ඔය සහ කුඹුරෙන් ද, නැගෙනහිරට : ඇලෙන් ද (ගොඩ ඉඩම සහ කුඹුරට හිමිකම් පාන එස්. මද්දුම බණ්ඩාර) දකුණට : පාරෙන් ද (එච්) සහ බස්නාහිරට : කදුරෙන් ද යන මෙකී මායිම් තුළ පිහිටි ඉඩම බලයලත් මානක එස්. පී. රත්නායක විසින් 2011.01.28 වැනි දින මැන සාදන ලද අංක 4195 දරන පිඹුර ප්‍රකාරව අක්කර දෙකයි රූඩ් දෙකයි පර්චස් පහළොවයි දශම හයයි බිංදුවයි (අ. 2, රූ. 2, පර්. 15.60) සහ එම දේපලට අයත් ගහකොළ, වගාව, ගොඩනැගිලි තේ කර්මාන්ත ශාලාව තේ වගාම අනෙකුත් වගාවන් ඇතුළු කර්මාන්ත ශාලාවේ ක්‍රියාකාරිත්වය සඳහා දැනට පාවිච්චි කරන ලද සියලුම යන්ත්‍ර යන්ත්‍රෝපකරණ ඇමනුම් ආයුද මෙවලම් යනාදිය ඇතුළුව ද වේ.

### දෙවන උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ පොල්ගහවෙල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ බණ්ඩාව ග්‍රාම නිලධාරී වසම උඩපොල ඕතොට කෝරළේ දඹදෙනි හත්පත්තුවේ බණ්ඩාව ගමේ පිහිටි කහටගහමුල කුඹුරේ වගලේ නැගෙනහිර පැත්තේ පිල්ලෑව නමැති ඉඩමට බලයලත් මානක ආර්. එන්. කරුණාතිලක විසින් 2005.01.02 වැනි දින මැන සාදන ලද අංක 1365 දරන පිඹුරේ නිරූපිත බෙද වෙන් කළ ලොට් 02 දරන ඉඩම් කොටසට මායිම්, එනම් උතුරු-බස්නාහිරට : ප්‍රධාන පාරේ සිට දිවෙන පාරෙන් ද, උතුරු-නැගෙනහිරට : ඉහත කී පිඹුරේ නිරූපිත ලොට් 01න් ද, දකුණු-නැගෙනහිරට : එම්. එස්. සැම්සුන් සහ අයට අයත් ඉඩමේ වැටෙන් ද, (බලයලත් මානක ඩබ්ලිව්. එම්. පී. බී. විජේකෝන් විසින් සාදන ලද අංක 11/92 පිඹුරේ ලොට් 02) සහ දකුණු-බස්නාහිරට : ඉහත කී පිඹුරු අංක 1365හි නිරූපිත ලොට් 03 ප්‍රධාන පාරට දිවෙන පාරෙන් ද, යන මෙකී මායිම් තුළ පිහිටි ගහකොළ, වගාව, ගොඩනැගිලි ඇතුලු අනෙකුත් සියලු දේ ඉඩමේ ප්‍රමාණය පර්චස් දහයයි දශම අටයි තුනයි (අ. 0, රූ. 0, පර්. 10.83)

මෙය කුරුණෑගල ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව ටී 03/69 ලියාපදිංචි කර ඇත.

### 3 වන උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ පොල්ගහවෙල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ අංක 922 බණ්ඩව ග්‍රාම නිලධාරී වසම උඩපොල ඕතොට කෝරළේ දඹදෙනි හත්පත්තුවේ බණ්ඩාව ගමේ පිහිටි වරිපනම් අංක 110, 112 සහ 112/1 දරන මිල්ලගහමුලවත්ත, කැටකැලගහමුලවත්ත සහ වැව්ලියද්දේ කුඹුර දැන් ගාර්ඩන් වර්තමානයේ හඳුන්වනු ලබන්නේ කුරුණෑගල ඔයිල් මිල්ස් නමැති ඉඩමට බලයලත් මානක ජී. එස්. ගලගෙදර විසින් 1998.07.23 වැනි දින මැන සාදන ලද අංක 5859 දරන පිඹුරේ නිරූපිත බෙද වෙන් කළ ලොට් 01 දරන ඉඩම් කොටසට මායිම් එනම්, උතුරට : ගම්මුන්ගේ ඉඩම් සහ ප්‍රාදේශීය සභා පාරෙන් ද, නැගෙනහිරට : කොළඹ කුරුණෑගල ප්‍රධාන පාරෙන් ද, දකුණට : රජයේ ඉඩමේ පිහිටි පවර්ලුම් එකෙන් හා නසීම් යන අය හිමිකම් පාන ඉඩමෙන් ද, බස්නාහිරට : ගම්මුන්ගේ ඉඩම් හා නසීම් යන අය හිමිකම් පාන ඉඩමෙන් ද යන මෙකී මායිම් තුළ පිහිටි ගහකොළ, වගාව, ගොඩනැගිලි ඇතුළු අනෙකුත් සියලු දේ. ඉඩමේ ප්‍රමාණය අක්කර එකයි පර්චස් තිස් එකයි දශම පහයි බිංදුවයි (අ. 1, රූ. 0, පර්. 31.50)

මෙය කුරුණෑගල ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව ටී 136/106හි ලියාපදිංචි කර ඇත.

ආර්. ඒ. පී. රාජපක්ෂ,
සමාගම් ලේකම්.

2019 ඔක්තෝබර් මස 22 වැනි දින.

01 - 446

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.